**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

| **2020 ජනවාරි 07** | **ක්ෂුද්‍රමූල්‍ය පනතේ රීති** | **2020 අංක 01** |
|---|---|---|

## බලපත්‍රය අලුත් කිරීම සඳහා අයදුම්පත්‍රය

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 13(2) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | බලපත්‍රය අලුත් කිරීම | 1.1 | සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්ම සෑම වසරකම නොවැම්බර් මස ඇතුළත සිය බලපත්‍රය අලුත් කිරීම සඳහා අයදුම් කළ යුතුය. |
| | | 1.2 | බලපත්‍රය අලුත් කිරීම සඳහා වන අයදුම්පත්‍රය මෙහි සඳහන් ඇමුණුමෙහි ඇති ආකෘතිය ප්‍රකාරව විය යුතුය. |
| 2. | 2020 වර්ෂය සඳහා බලපත්‍රය අලුත් කිරීම | 2.1. | ඉහත 1.1 රීතිය එලෙස පැවතියද, 2020 වර්ෂය සඳහා පමණක් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වලට 2020 ජනවාරි 31 දින හෝ ඊට පෙර බලපත්‍ර අලුත් කිරීම සඳහා අයදුම් කළ හැකිය. |

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

**ඇමුණුම**

**2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා අයදුම්පත්‍රය**

**උපදෙස්**

1. සියලුම අයදුම්පත් යතුරුලියනය කර හෝ ඉතා පැහැදිළි අකුරින් ලියා තිබිය යුතුය.

2. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඇමුණුම් ද ඇතුළත්ව සෑම පිටුවක්ම අඩුම වශයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් කෙටිසන් තැබිය යුතුය.

3. අයදුම්කරන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයින්ගේ අත්සන් සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත, අනිකුත් ලේඛනද සමග පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ**
**බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**නො. 30 , ජනාධිපති මාවත**
**කොළඹ 01**
**ශ්‍රී ලංකාව**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත
ශ්‍රී ලංකා මහ බැංකුව

කොළඹ 01.

........................................................................................................................................................................පිහිටි

(ලිපිනය)

........................................................................................................................................................................

(නම)

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධිවිධානයන්ට අනුකූලව බලපත්‍රයක් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත මෙයින් අයදුම් කරනු ලැබේ. අයදුම්පත සනාථ කිරීම සඳහා පහත තොරතුරු හා ලේඛන ඉදිරිපත් කරනු ලැබේ.

1) සමාගමේ සාමාන්‍ය තොරතුරු

1.1. ප්‍රධාන/ පරිපාලන කාර්යාලයෙහි ලිපිනය (ලියාපදිංචි ලිපිනයෙන් වෙනස් වේ නම්)

1.2. සමාගම් ලේකම්

1.3. සමාගම් ලේකම්වරයාගේ ලිපිනය:

1.4. විගණකවරු **(බාහිර)**

1.4.1. බාහිර විගණකගේ නම, ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි තොරතුරු:

1.4.2. විගණන ආයතනයේ හවුල්කරුවන්/අධ්‍යක්ෂවරුන් සමාගමේ කොටස් හිමියන් වේද? (ඔව් නම් කරුණාකර විස්තර සපයන්න).

1.4.3. පසුගිය මූල්‍ය වර්ෂ තුන සඳහා ගෙවන ලද විගණන ගාස්තු:

1.4.4. විගණක විසින් සමාගමට වෙනත් සේවාවක් සපයන්නේ නම් හෝ පෙර වර්ෂයේදී සමාගම සමඟ වෙනත් ගනුදෙනුවක් කර තිබේ ද? (ඔව් නම් විස්තර සපයන්න):

1.4.5. විගණන ආයතනයට හෝ විගණන ආයතනයේ හවුල්කරුවකුට/අධ්‍යක්ෂවරයෙකුට හෝ විගණකවරයාගේ සමීප ඥාතියෙකුට කුමන හෝ ආකාරයේ මූල්‍ය පහසුකමක් ලබා දී ඇත්ද? (ඔව් නම් කරුණාකර විස්තර සපයන්න).

1.5. ව්‍යාපාර ස්ථාන සංඛ්‍යාව

1.6. සේවක සංඛ්‍යාව

1.7. සමාගමේ මූලික ප්‍රාග්ධනය (ඇමුණුම )

1.8. වත්කම්වල ගුණාත්මකභාවය (ඇමුණුම)

1.9. ණය පොලී අනුපාත (ඇමුණුම)

1.10. අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ලේඛන

1.10.1. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් සහ අයදුම්කාර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී පිළිවෙලින් ඇමුණුම IV සහ ඇමුණුම V හි සඳහන් දිවුරුම් ප්‍රකාශයක් සහ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

1.10.2. එළඹෙන දින දර්ශන වර්ෂය සඳහා වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්ම.

1.10.3. අයදුම්පත ඉදිරිපත් කළ මාසයට පෙර මාසය අවසානයේදී අවම මූලික ප්‍රාග්ධනයක් මට්ටම පවත්වාගැනීම පිළිබඳව බාහිර විගණකගෙන් තහවුරු කිරීමේ ලිපියක්.

මෙම අයදුම්පතේ සඳහන් තොරතුරු පරීක්ෂා කළ බවත්, ඒවා සෑම අතින්ම සම්පූර්ණ බවත් සහ අපගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, අපි ප්‍රකාශ කර සිටිමු.

..........................................................................................................................................................................................................................වෙනුවෙන්

(අයදුම්කරන සමාගමේ නම)

| | අධ්‍යක්ෂවරුන්ගේ නම් | අත්සන |
|---|---|---|
| 1 | ........................................................................................ | .................................................... |
| 2 | ...................................................................................... | .................................................... |
| 3 | ..................................................................................... | ................................................. |
| 4 | .................................................................................... | ................................................. |
| 5 | ..................................................................................... | ..................................................... |
| 6 | .................................................................................... | ..................................................... |
| 7 | ................................................................................. | ................................................... |
| 8 | ..................................................................................... | ................................................... |
| 9 | ....................................................................................... | .................................................... |

දිනය :- ........................................

(සමාගමේ පොදු මුද්‍රාව)

*ඇමුණුම I*

**සමාගමේ මූලික ප්‍රාග්ධනය**

විගණනය කරන ලද ගිණුම් වලට අනුව වහාම පූර්ව මූල්‍ය වර්ෂය සඳහා සහ අයදුම්පත ඉදිරිපත් කළ මාසයට පෙර මාසය අවසානයේදී.

| අයිතමය | ............. දිනට | ............. දිනට |
|---|---|---|
| අ) නිකුතු සහ සම්පූර්ණයෙන් ගෙවා නිමි කොටස් (මුදලට) | | |
| ආ) නිකුතු සහ සම්පූර්ණයෙන් ගෙවා නිමි සමුච්චිත නොවන නිදහස් කළ නොහැකි කොටස් (මුදලට) | | |
| ඇ) ව්‍යවස්ථාපිත සංචිත | | |
| ඈ) පොදු සංචිත | | |
| ඉ) පසුගිය විගණන වාර්තාවට අනුව රඳවාගත් ලාභය හෝ (අලාභය) | | |
| ඊ) පවතින වසරේ ප්‍රකාශයට පත් නොකළ ලාභය හෝ (අලාභය) | | |
| ඉ) මූලික ප්‍රාග්ධනය (අ) සිට ඊ) දක්වා) | | |

***ඇමුණුම II***

**වත්කම්වල ගුණාත්මකභාවය**

| ණය වර්ගය | ක්‍රමික ණය | | අක්‍රමික ණය | | | | | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | හිඟ නොමැති | | දින 61 -120 දක්වා හිඟ | | දින 121 -180 දක්වා හිඟ | | දින 181 -360 දක්වා හිඟ | | දින 360 ට වඩා හිඟ | | | |
| | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු '000) | ගිණුම් සංඛ්‍යාව | පිටහිටි ශේෂය (රු '000) |
| කාලීන ණය | | | | | | | | | | | | |
| කල්බදු | | | | | | | | | | | | |
| කුලී පිට ගැණුම් | | | | | | | | | | | | |
| උකස් ණය | | | | | | | | | | | | |
| වෙනත් | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | |

***ඇමුණුම III***

**ණය පොලී අනුපාතික/අයකිරීම්**

<table>
<tr><td rowspan="3">ණය වර්ගය</td><td colspan="6">ණය පොලී අනුපාතික (පරාසය/වාර්ෂික)</td><td colspan="2">පැහැරහැරීමේ ගාස්තු</td></tr>
<tr><td colspan="3">මාස 12 ට අඩු</td><td rowspan="2">මාස 12</td><td rowspan="2">මාස 24</td><td rowspan="2">මාස 24 ට වැඩි</td><td rowspan="2">%</td><td rowspan="2">මුදල<br>(රු. '000)</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
</table>

*ඇමුණුම IV*

**අධ්‍යක්ෂවරයකු/ප්‍රධාන විධායක නිලධාරිවරයකු/ප්‍රධාන කළමනාකරුවකු/එවැනි පත්වීමක් සඳහා තෝරාගන්නා ලද පුද්ගලයකු විසින් ඉදිරිපත් කල යුතු දිවුරුම් ප්‍රකාශයේ ආකෘතිය**

**දිවුරුම් ප්‍රකාශය**

..............................................................................................................................................................(ලිපිනය) හි පදිංචි ........................................................................................................ හැඳුනුම්පත් අංක/ගමන් බලපත්‍ර අංක දරන ........................................................................................................................................(සම්පූර්ණ නම) වන මම බෞද්ධ/හින්දු/ක්‍රිස්තියානි/කතෝලික/මුස්ලිම් ආගමිකයකු වශයෙන් ගාම්භීර පූර්වකව ද, අවංකව ද, සත්‍යවාදීව ද මෙසේ සහතික කරමින් ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි[1].

1. ඉහත නම සඳහන් ප්‍රතිඥාකරු/දිවුරුම්කරු මම වෙමි.
2. මම .........................................................................................................(සමාගමේ නම) ආයතනයේ ......................................................................................(තනතුර) ලෙස කටයුතු කරමි.
3. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලිසියක්, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක්, වෘත්තියවේදීන්ගේ සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, හෝ වෙනත් නීතිමය ආයතනයක් මගින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
4. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් හෝ ඕනෑම නීතියක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද්දා වූ, රීති, රෙගුලාසි, විධාන හෝ නිර්ණයන්ට අනුකූල නොවීම වැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීති මඟින් පිහිටුවන ලද අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරයකින්, වෘත්තියවේදීන්ගේ සංගමයකින්, විමර්ශන කොමිෂන් සභාවකින්, විනිශ්චය සභාවකින් හෝ වෙනත් මණ්ඩලයකින් වැරදිකරුවෙකු හෝ එකී ක්‍රියාවට සම්බන්ධ පාර්ශවයක් ලෙස හඳුනාගෙන වැරදිකරුවකු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
5. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වන වරදකට අධිකරණයකින් වැරදිකරු වී හෝ එවැනි වරදක් සම්බන්ධයෙන් අධිකරණයකින් චෝදනා ලබා නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
6. මම කිසියම් අධිකරණයකින් සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වරදකට වැරදිකරුවකු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
7. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් අධිකරණයකින් වස්තු භංගත්වයට හෝ බංකොලොත් භාවයට පත් බවට ප්‍රකාශ කර නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
8. මම ණය ආපසු ගෙවීමට කිසියම් අධිකරණයකින් දෙන ලද නියෝගයක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

9. මම නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක් විසින්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් ආයතනයක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරි හෝ වෙනත් නිලධාරියකු ලෙස සේවයෙන් ඉවත් කර හෝ සේවය අත්හිටුවා නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

10. මම අධිකරණයක් මඟින් සිහි විකල් වූ පුද්ගලයකු ලෙස ප්‍රකාශයට පත්වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

11. මම

අ) නියාමන හේතූන් මත බලපත්‍රය හෝ ව්‍යාපාරය අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ හෝ

ආ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක දී ඈවර වූ හෝ ඈවර වෙමින් පවතින හෝ අනිවාර්යය ඈවර කිරීමකට යටත්ව සිටින්නා වූ ඕනෑම බලපත්‍රලාභී බැංකුවක, බැංකු නොවන මූල්‍ය ආයතනයක, අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරියකු හෝ වෙනත් බලතල සහිත තනතුරක් දරා නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

12. මම වෙනත් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක අධ්‍යක්ෂවරයෙක් හෝ සේවානියුක්තිකයකු නොවන බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

මෙම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතිඥාකරුට/ /දිවුරුම්කරුට කියවා තේරුම්කර දුන් අතර, ඔහු/ඇය එම කරුණු සත්‍ය බවට පිළිගෙන සහතික කර/දිවුරා ....................... දින ....................................... දී මා ඉදිරිපිටදී අත්සන් තබන ලදී.

අදාළ පරිදි මුද්දර අලවන්න.

මා ඉදිරිපිටදී

සමාදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්

සටහන: 1 - අදාළ නොවන වචන කපා හරින්න.

- ක්‍රිස්තියානි සහ කතෝලික පුද්ගලයන් දිවීරා ප්‍රකාශ කර සිටිය යුතු අතර බෞද්ධ, හින්දු, මුස්ලිම් සහවෙනත් ආගම් අදහන පුද්ගලයන් සහතික කරමින් ප්‍රතිඥා දිය යුතුය.

***ඇමුණුම V***

**සමාගමේ නම : ...................................................................................................................................**

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී/එවැනි පත්වීමක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙක් විසින් ඉදිරිපත් කල යුතු ප්‍රකාශය**

**(................ දිනට අදාළ ඇමුණුම් සහිතව)**

**1. පුද්ගලික තොරතුරු**

1.1. සම්පූර්ණ නම:...............................................................................................................................

1.2. ජාතික හැඳුනුම් පත් අංකය:.............................................................................................................

1.3. විදේශ ගමන් බලපත්‍ර අංකය:...........................................................................................................

1.4. උපන් දිනය: ................................................................................................................................

1.5. ස්ථිර ලිපිනය: .............................................................................................................................

1.6. වර්තමාන ලිපිනය: .......................................................................................................................

**2. අයදුම්කරන සමාගමෙහි පත්වීම**

2.1. මණ්ඩලයට/වර්තමාන තනතුරට පත්වූ දිනය: ...................................................................................

2.2. තනතුර: .....................................................................................................................................

2.3. දේශීය හෝ විදේශික බව: ..............................................................................................................

2.4. වාර්ෂික වේතනය ( විස්තර සහිතව):

2.5. අධ්‍යක්ෂවරයා හෝ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ/හෝ ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජිකයින් සමාගමේ වත්කම් භාවිතයෙන් උපයාගත් ප්‍රතිලාභ වල වාර්ෂික වටිනාකම:
(උදා: සමාගමේ භූමිය, ගොඩනැගිලි, වාහන ආදිය)

2.6. ඉහත 2.5 සඳහන් වත්කම් නඩත්තුව සඳහා හෝ වියදම් ප්‍රතිපූරණය (ණය කාඩ්, බිල්පත්, උපයෝගිතා බිල්පත් යනාදිය) සඳහා සමාගම විසින් දැරූ වියදම්.

2.7. එම වත්කම් මිලදී ගත් අගය සහ පොත් අගය හා නිශ්චල වත්කම් පිහිටා ඇති ස්ථානය.

**3. ඥාතීන්ගේ පුද්ගලික තොරතුරු**

3.1. කලත්‍රයාගේ සම්පූණ නම: ..............................................................................................................

3.2. ජාතික හැඳුනුම් පත් අංකය: ............................................................................................................

3.3. විදේශ ගමන් බලපත්‍ර අංකය: ..........................................................................................................

3.4. යැපෙන දරුවන්ගේ විස්තර:

| | සම්පූර්ණ නම | ජා.හැ. අංකය | ගමන් බලපත්‍ර අංකය |
|---|---|---|---|
| 3.4.1 | | | |
| 3.4.2 | | | |
| 3.4.3 | | | |

**4. බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් වල සහ ඒ ආශ්‍රිත සමාගම් වල කොටස් හිමිකම**

බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්, ඒවායේ පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් වල දැනට දරන කොටස් හිමිකාරිත්වයක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර:

| ආයතනයේ නම | කොටස් ගණන | හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

**5. ව්‍යාපාරික ගනුදෙනු**

අයදුම්කරන සමාගම, එහි පාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් (ඇත්නම්) සහ අනෙකුත් මූල්‍ය සමාගම් සමඟ අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී හෝ එවැනි පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ පුද්ගලයෙකු විසින් දැනට පවත්වාගෙන යන කුමන ආකාරයේ හෝ ව්‍යාපාරික ගනුදෙනු වේ නම් ඒ පිළිබඳ විස්තර.

| ආයතනයේ නම | ගනුදෙනුවේ ස්වභාවය | දිනට වටිනාකම දින/මාස/අවු (රුපියල් මිලියන) | | ණය වර්ගීකරණය (ක්‍රමික/අක්‍රමික) | සුරැකුම් | |
|---|---|---|---|---|---|---|
| | | සීමාව | පිටහිටි ශේෂය | | වර්ගය | වටිනාකම (රු. මිලියන) |
| | | | | | | |
| | | | | | | |

6. ඉහත දැක්වූ තොරතුරු වඩාත් පැහැදිලි වීමට අදාළ වෙනත් විස්තර/තොරතුරු සහ අයදුම්කරන සමාගමක අධ්‍යක්ෂවරයාගේ හෝ ප්‍රධාන විධායක නිලධාරියාගේ හෝ සාමාන්‍යාධිකාරීගේ හෝ එවැනි තනතුරක් සඳහා තේරීපත්වන පුද්ගලයෙකුගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අදාළ වේ යැයි හැඟෙන වෙනත් තොරතුරු.

**ප්‍රකාශය**

ඉහත මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනුමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවටත් සම්පූර්ණ බවටත් තහවුරු කරමි. ඉහත සපයන ලද තොරතුරු වලට අදාළව, කිසියම් වෙනසක් වූ වහාම, සියලු තොරතුරු බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ නිසි පරිදි දැනුවත් කරන බවට මම පෙරොන්දු වෙමි.

ඉහත තනතුර දැරීම සඳහා කිසියම් නීතියකින් මා හට සීමාවන් පනවා නොමැති බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

**දිනය:..............................** ..........................................................................................

**අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි හෝ එවැනි පත්වීමක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙකුගේ අත්සන**

**අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් සම්පූර්ණ කිරීම සඳහා**

ඉහත සපයන ලද තොරතුරු හා බැඳෙන වෙනත් පැහැදිලි කිරීම්/ තොරතුරු සහ අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරි හෝ සාමාන්‍යාධිකාරි හෝ එවැනි තනතුරක් සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයෙකුගේ හෝ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අදාළ වේ යැයි හැඟෙන වෙනත් තොරතුරු.

**දිනය: ...............................................** ..................................................................................

**අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිගේ අත්සන**